ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ දකුණ) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2344982, 2393678 ෆැක්ස් අංකය : 4717009.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස්
හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145,
071- 8021206.

04-585/1

**මහජන බැංකුව - කිරුලපන ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළ දෙකක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ, මා විසින් වර්ෂ 2014 මැයි මස 10 වැනි දින පෙ. ව. 11.30 ට පහත සඳහන් ඇටඹගහවත්ත නමැති ඉඩම සහ නිවස දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ නුගේගොඩ ගංගොඩවිල දෙල්කඳ හංදියට පැමිණ මහරගම දෙසට යන විට "ඇටඹගහවත්ත" කියනු ලබන ඉඩමේ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) සහ එහි පිහිටි සියලු වැව්ලි සහ ගොඩනැගිලි ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014ක් වූ මැයි මස 10 වැනි දින පෙ. ව. 2.30 ට පහත සඳහන් ඉඩම සහ ගොඩනැගිලි දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව තුළ ගංගොඩවිල පරණ කැස්බෑව පාරේ "මීමැදිඹිවිට" කියනු ලබන ඉඩමේ පර්චස් දහඅටයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 18.5) සහ එහි පිහිටි සියලු වැවිලි සහ ගොඩනැගිලි ද වේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2013.11.01 වැනි දින ද, ඩේලිනිව්ස් දිනමිණ 2013.12.25 වැනි දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළ පිවිසීම 1 සහ 2 :*

1. නුගේගොඩ හන්දියේ සිට දෙල්කඳ හන්දියට පැමිණ එතැන් සිට මීටර් 450ක් මහරගම දෙසට යන විට "ශාන් ඔටෝ ට්‍රේඩර්ස්" අසලින් දකුණට ඇති පාරේ මීටර් 20ක් පමණ යනවිට වම් පසට ඇති පාරේ මීටර් 15ක් පමණ යන විට අදාළ දේපළ පිහිටා ඇත.

2. නුගේගොඩ සිට දෙල්කඳ හන්දියට පැමිණ දකුණට ඇති පරණ කැස්බෑව පාරේ නුගේගොඩ දෙසට මීටර් 10ක් පමණ යන විට පාරේ වම් පසට ඇති අඩි 10 ක පාරේ ඇතුළට ඇති දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ,
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා සෝෂක ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ දකුණ) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2344982, 2393678 ෆැක්ස් අංකය : 4717009

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස්
හා දිවුරුම් ලත් භාෂා පරිවර්ථක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145
071- 8021206.

04-585/2

---

**මහජන බැංකුව - මාදම්පේ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයට අයත් උතුරු පිටිගල් කෝරළේ, යගම්පත්තුවේ හලාවත ප්‍රාදේශීය බල ප්‍රදේශයේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ඌරලියාගාර ග්‍රාමසේවක වසමට අයත්, ඌරලියාගාර නමැති ගමේ පිහිටි හංදිවත්ත හෙවත් බෝගහහන්දිය ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩංස්ටන් පෙරේරා විසින් සාදන ලද 2011 සැප්තැම්බර් මස 28 වැනි දිනැති අංක 8000 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 18.03

එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියල්ල සහිතව හලාවත ඉඩම් ලියාපදිංචි කිරීම් කාර්යාලයේ අංක ආර් 103/42 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - මාදම්පේ මහජන බැංකුවේ සිට නගර මධ්‍යයට පැමිණ දුම්රිය හරස් පාර පසුකර ඉදිරියට යන විට කුරුණෑගල පාර සහ මැදගම පාර බෙදීයන ස්ථානයේ එම පාරවල් දෙකට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

ඉහත කී ඌරලියාගාර ග්‍රාමයේ පිහිටි, කෝන්ගහවත්ත හෙවත් මාරගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩංස්ටන් පෙරේරා විසින් සාදන ලද, 2011 මාර්තු මස 16 වැනි දිනැති අංක 7001 ඒ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 06

එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියල්ල සහිතව හලාවත ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක R 103/43 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.*- මාදම්පේ මහජන බැංකුවේ සිට නගර මධ්‍යයට පැමිණ දකුණු පැත්තට ඇති පැරණි මාදම්පේ නගරය දෙසට ඇති මාර්ගයට පිවිස මාර්ගයේ වම් පසින් සමුපකාර සමිති ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිරිපසින් දීපාලෝක ස්ටෝර්ස් ව්‍යාපාරික ස්ථානය හමුවේ.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2014 මැයි 08 වැනි බ්‍රහස්පතින්දා දින පිළිවෙළින් පෙ. ව. 11.00 සහ 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2013 ඔක්තෝබර් මස 01 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2013 දෙසැම්බර් මස 30 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - එක් එක් වෙන්දේසිය අවසානයේ මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු යः-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ. දුරකථන අංක 032- 2253300, 032-2253301 ෆැක්ස් අංකය 032- 2255247.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්.
වසර 122ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

04-540

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**ගම්පහ දිස්ත්‍රික්කයේ, පහළ බියන්විල පිහිටි පර්චස් 20ක් විශාලැති අගනා දේපළක්**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ පහළ බියන්විල පිහිටි "දළුක්ගහලන්ද" නොහොත් "අඹගහවත්ත" නැමති ඉඩමට (අංක 3836 දරන පිඹුරේ සඳහන් කැබලි අංක බී හි අනු බෙදීමක් වන) අංක 591 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 02 දරන ඉඩම් කොටස.

අංක 1097 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැලියගොඩ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි ස්ලීක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති හෙයින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2014ක් වූ මැයි මස 05 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2013.03.29 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2013.03.13 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" සහ 2013.03.13 වැනි දින තිනකුරල් පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ට වන මාර්ගය .- කිරිබත්ගොඩ නගර මධ්‍යයේ සිට නුවර දෙසට කි. මී. 1.7ක් ගමන් කර දකුණට හැරී බංගලාවත්ත පාරේ මීටර් 100ක් පමණ ගමන් කර නැවතත් දකුණට හැරී මීටර් 75ක් පමණ ගමන් කර නැවතත් දකුණට හැරී කොටසක් තාර දමා ඇති 1 වන පටුමගට හැරී අඩි 12ක් පළලැති පුද්ගලික පාරේ බෑවුමෙන් පහළට බැසීමෙන් පසුව පාරේ වමට පිහිටා ඇති මෙම දේපළ හමුවේ.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි.- (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ, අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011-7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777- 672082
ෆැක්ස් අංකය : 2871184.

04-527

---

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පණතෙහි 29 ඩී වන වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - කඩවත**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරිපත්තුවේ ඉහළ බියන්විල පිහිටි ඇටඹගහවත්ත හෙවත් නැදුන්ගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. පෙරෝ විසින් සාදන ලද, 1976 ඔක්තෝබර් මස 25 වැනි දිනැති අංක 6292 දරන පිඹුරේ ලොට් අංක බී2බී ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 29.6

ඉහත කී 6292 දරන පිඹුරට අනුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක සී 474/251 යටතේ ලියාපදිංචි කර ඇත. එහි පිහිටි වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියල්ල සහිතව පහත විස්තර කෙරෙන ඉඩම හරහා වැටී ඇති මාර්ගයේ අයිතිය ද සමග ඉහත කී ඉහළ බියන්විල පිහිටි, ඇටඹගහවත්ත හෙවත් නැදුන්ගහවත්ත ලෙස හැඳින්වෙන අංක 6292 දරන පිඹුරේ ලොට් අංක බී2ඩී ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූ. 0, පර්. 6.2

ඉහත කී 6292 දරන පිඹුරට අනුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක සී 519/244 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - කොළඹ සිට නුවර පාර ඔස්සේ කිලෝ මීටර් 16ක් පමණ ගමන් කර දකුණට ඇති ජායා මාවතට හැරී මීටර් 200ක් පමණ ගමන් කරන්න. එතැනින් දකුණට ඇති බොරළු පාරට හැරී තවත් මීටර් 50ක් පමණ ගමන් කරන්න. අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2014 මැයි මස 07 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත කී දේපළ වයි. පතිරගේ මහතා- පැට්මෝ එන්ටර්ප්‍රයිසස් විසින් මහජන බැංකුව වෙත උකස් කරන ලද්දකි.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2011 ජනවාරි මස 17 වැනි දින පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු, ණය අයකර ගැනීම්, ආයතනික බැංකු ශාඛාව, මහජන බැංකුව, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක : 2320651-6/2437239-41.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්.
වසර 122ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

04-539

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - ජාඇල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### පළමුවන උපලේඛනය

බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් 2006 දෙසැම්බර් මස 15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 4213 හි දැක්වෙන පරිදි බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල නගර සභා සීමාවේ කණුවන පිහිටි දවටගහවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග ලොට් 1 දරන පර්චස් විසි අටයි දශම තුනක් (අ. 0 රූ. 0 පර්. 28.3)

මතු දැක්වෙන කනුවන පිහිටි දවටගහවත්ත නමැති ඉඩම වෙනුවෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් 1964 දෙසැම්බර් මස 6 වැනි දින සාදන ලද පිඹුරු අංක 242 හි ලොට් 5 දරන (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස පර්චස් හයයි දශම පහ (අ. 0 රූ. 0 පර්. 6.5).

### දෙවන උපලේඛනය

බලයලත් මිනින්දෝරු ජේ. එම්. එෆ්. එස්. වීරසිංහ විසින් 2008 මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 117/1 හි දැක්වෙන පරිදි බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ දඩුගම ගමේ පිහිටි කැටකැලගහවත්ත ඉඩමේ (පිඹුරු අංක 117 හි ලොට් 1 සහ 2 වශයෙන් දැක්වෙන කැටකැලගහවත්ත ඉඩමේ එකතුවක්) ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන රූඩ් එකයි පර්චස් පහළොවයි දශම හතරක් (අ. 0 රූ. 1 පර්. 15.4) හෙවත් හෙක්ටයාර් 0.14012

### තුන්වන උපලේඛනය

බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් 2004 දෙසැම්බර් මස 07 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 3571 දැක්වෙන පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ දකුණු රාගම් පත්තුවේ බටගම (දකුණ) ගනේමුල්ල පාරේ පිහිටි වරිපනම් අංක 136/27 දරන සියඹලාගහවත්ත සහ හික්ගහවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන පර්චස් තිස්නවයයි දශම තුනයි පහ (අ. 0 රූ. 0ප ර්. 39.35)

### හතරවන උපලේඛනය

බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 2007 සැප්තැම්බර් මස 20 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 9502 දැක්වෙන පරිදි බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ දඩුගම උප කාර්යාල සීමාවේ දඩුගම ගමේ පිහිටි දංගහවත්ත හෙවත් දවටගහවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 3ඒ දරන පර්චස් දොළහයි දශම හතයි දෙකක (අ. 0 රූ. 0 පර්. 12.72)

### පස්වන උපලේඛනය

1. බලයලත් මිනින්දෝරු එච්. ඒ. ආර්. පත්මසිරි විසින් 2004 පෙබරවාරි මස 15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 362 හි දැක්වෙන පරිදි

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ බටුවත්ත උප කාර්යාල සීමාවේ උතුරු බටගම පිහිටි සාන්ත ඇන්තනි පාරේ වරිපනම් අංක 256 දරන මුණමල්ගහවත්ත සහ තල්ගහවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන අක්කර දෙකයි පර්චස් නමයයි දශම පහ (අ. 2 රූ. 0 පර්. 9.5)

2. බලයලත් මිනින්දෝරු එච්. ඒ. ආර්. පත්මසිරි විසින් 2004 පෙබරවාරි මස 15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 362 හි සඳහන් පරිදි ඉහත කී සාන්ත ඇන්තනී පාරේ වරිපනම් අංක 256 දරන මුණමල්ගහවත්ත, මුණමල්ගහවත්ත සහ තල්ගහවත්ත නැමති ඉඩමේ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් බී දරන රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම දෙකයි පහ
(අ. 0 රූ. 2 පර්. 11.25)

3. බලයලත් මිනින්දෝරු එච්. ඒ. ආර්. පත්මසිරි විසින් 2004 පෙබරවාරි මස 15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 362 හි සඳහන් පරිදි ඉහත කී සාන්ත ඇන්තනී පාරේ වරිපනම් අංක 256 දරන මුණමල්ගහවත්ත, මුණමල්ගහවත්ත සහ තල්ගහවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් ඩී දරන රූඩ් දෙකයි පර්චස් දහතුනයි දශම දෙකයි පහ (අ. 0 රූ. 2 පර්. 13.25) මාර්ග අයිතිය ද සමඟ වේ.

ඉහත සඳහන් උතුරු බටගම පිහිටි මුණමල්ගහවත්ත, මුණමල්ගහවත්ත සහ තල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ආර්. පත්මසිරි විසින් 2004 පෙබරවාරි මස 15 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 362 හි දැක්වෙන ලොට් සී (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) දැක්වෙන ඉඩම පර්චස් තිස්දෙකයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 32.5) ක් වේ.

මෙහි පළමුවන, හතරවන සහ පස්වන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන ජාඇල, කනුවණ, පෙරේරා පාරේ, අංක 9/2ඒ ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි රණසිංහ හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කර ඇත.

මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන ජාඇල, කණුවන, පෙරේරා පාරේ, අංක 9/2ඒ ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි රණසිංහ හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස ද, කුරණගේ රෝච් රන්ජන් පෙරේරා රණසිංහ සහ ඉච්චම්පුල්ලිගේ ජිවා සුසුදුමලී ප්‍රනාන්දු උකස්කරුවන් ලෙස කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කර ඇත.

මෙහි තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන ජාඇල, කනුවණ, පෙරේරා පාරේ, අංක 9/2ඒ ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි රණසිංහ හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස ද, කුරණගේ රෝච් රන්ජන් පෙරේරා රණසිංහ උකස්කරු ලෙස කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇත.

(1) 1 වන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 1 පර්චස් විසිඅටයි දශම තුනක් (අ. 0 රූ. 0 පර්. 28.3)
වර්ෂ 2014 ක් වූ මැයි මස 09 වැනි දින පෙ. ව. 11.00 ට

(2) 2 වැනි උපලේඛනයේ සඳහන් දේපළ ලොට් ඒ රූඩ් එකයි පර්චස් පහළොවයි දශම හතරක් (අ. 0 රූ. 1 පර්. 15.4) හෙවත් හෙක්ටයාර් 0.14012
වර්ෂ 2014ක් වූ මැයි මස 09 වැනි දින ප. ව. 12.00 ට

(3) 4 වන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 3 ඒ පර්චස් දොළහයි දශම හතයි දෙකක්
(අ. 0 රූ. 0 පර්. 12.72)

වර්ෂ 2014ක් වූ මැයි මස 09 වැනි දින ප. ව. 1.00 ට

(4) 5 වන උපලේඛනයේ සඳහන් දේපළ -

(1) ලොට් ඒ - අක්කර දෙකයි පර්චස් නමයයි දශම පහ
(අ. 2 රූ. 0 පර්. 9.5)
(2) ලොට් බී - රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම දෙකයි පහ
(අ. 0 රූ. 2 පර්. 11.25)
3) ලොට් ඩී - රූඩ් දෙකයි පර්චස් දහතුනයි දශම දෙකයි පහ
(අ. 0 රූ. 2 පර්. 13.25)

වර්ෂ 2014 ක් වූ මැයි මස 09 වැනි දින ප. ව. 3.00 ට

(5) 3 වැනි උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 2 පර්චස් තිස්නවයයි දශම තුනයි පහ
(අ. 0 රූ. 0 පර්. 39.35)
වර්ෂ 2014 ක් වූ මැයි මස 09 වැනි දින ප. ව. 4.00 ට

ඉහත උපලේඛනවල සඳහන් ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.02.07 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2014.02.10 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2014.04.17 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2014.04.17 වැනි දින ලක්බිම, වීරකේසරී සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩම්වලට පිවිසීම. -*

*පළමුවන උපලේඛනය - ලොට් 1*

කොළඹ කොටුවේ සිට මෙම දේපළ පිහිටි ස්ථානයට ප්‍රවේශ වීමට කොළඹ සිට පෑලියගොඩ දක්වා ගමන් කර පෑලියගොඩින් පුත්තලම මාර්ගයේ කි. මී. 15ක් ගමන් කළ විට ජාඇල පොලිස් ස්ථානය හමුවේ. එතැනින් දකුණට හැරී පරණ මීගමුව පාර/මිනුවන්ගොඩ පාරේ මීටර් 100ක් ගොස් දකුණට හැරී පිලිප් පෙරේරා පාරට පැමිණෙන්න. මෙම ඉඩම පාරේ වම්පැත්තේ ඇති 3 වැනි දේපළවල අතර පෙරේරා පාරට මුහුණලා අයිනට වෙන්න දකුණෙන් සහ නැගෙනහිරින් දුම්රිය මාර්ගයෙන් ද අවසානයේ නගර සභාවට අයත් තාර දමා ඇති වාහන ගමන් කළ හැකි පාරෙන්ද ඇතුල්විය හැක.

*දෙවන උපලේඛනය - ලොට් ඒ*

මෙම දේපළට ප්‍රවේශවීමට කොළඹ සිට පුත්තලම පාර (ඒ 3) කි. මී. 16.6 පමණ ගොස් දඬුගමට පැමිණෙන්න. මෙම ඉඩම පිහිටා ඇත්තේ පුත්තලම පාරට මුහුණලා පාරේ දකුණු පසින් තුඩැල්ල හංදියෙන් මීටර් 500ක් දුරින් ය. මෙය තට්ටු තුනකින් යුත් වැඩ නිම නොකළ ගොඩනැගිල්ලක් වන අතර දඬුගම මීගමුව පාරේ වරිපනම් අංක 120 ලෙස සඳහන් කර ඇත.

*තුන්වන උපලේඛනය - ලොට් 2*

කොළඹ නගර සභා සීමාවේ සිට (කැළණි පාලම) ආසන්නයේ ඇති මීගමුව ප්‍රධාන පාරේ (ඒ. 3) කි. මී. 11 පමණ (කොළඹ පිටකොටුවේ සිට කි. මී. 17.3ක්) කඳාන නගරයට පැමිණ එතැනින් දකුණට හැරී ගනේමුල්ල පාරේ (ආර්. ඩී. ඒ. දුම්රියපල පාර ලෙස කොටසක් හඳුන්වනු ලබන)

කි. මී. 1ක් පමණ ගමන් කර ද මැසනඩ් විද්‍යාලය දක්වා ගොස් එතැනින් දකුණට හැරී පොදු පාරට පැමිණ නිවාසවලට ඇති (කොන්ක්‍රීට් පාරේ) මීටර් 75ක් පමණ ගියවිට කොන්ක්‍රීට් පාරෙන් ඔබ්බට ඇති වාහන යා හැකි පාරෙන් දේපළ වෙත ප්‍රවේශ විය හැක.

*හතරවැනි උපලේඛනය - ලොට් 3* A

කොළඹ නගර සහා සීමාවේ සිට (කැළණි පාලම) මීගමුව ප්‍රධාන පාරේ (ඒ. 3) කි. මී. 18 පමණ ගියවිට දඩුගම දෙහියගාත හංදියට පැමිණ දේපළ වෙත පැමිණිය හැක. ආර්පිකෝ ප්‍රදර්ශනාගාරය අසල ඇති ප්‍රධාන පාරෙන් දකුණුපස දේපළ පිහිටා ඇත.

*පස්වැනි උපලේඛනය - ලොට්* A, B සහ D

ජාඇල නගරයේ සිට කොළඹ පාරේ මීටර් 750ක් පමණ ගියවිට ඇති වැලිගම්පිටිය හංදියෙන් වමට ඇති ගනේමුල්ල පාරේ. කි. මී. 1ක් පමණ ගොස් දකුණට හැරුණු විට ඇති බටගම පල්ලිය පාරේ (ශාන්ත ඇන්තෝනි පාර) මීටර් 600ක් ඉදිරියට ගියවිට (බටගම පල්ලිය පසුකර) දකුනු පසින් පාරට මුහුණලා දේපළ පිහිටා ඇත.

ඉහත බටගම පල්ලිය පාර කොළඹ - මීගමුව පාරට රිලවුල්ල හංදියෙන් කි. මී. 1ක් ගියවිට සම්බන්ධ වේ.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) නොතාරිස් ගාස්තුව රු. 2,000,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ජාඇල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංක : 011 - 2445393.
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 140, මීගමුව පාර,
ජාඇල.
දුරකථන අංක : 011- 2243614 - 5
ෆැක්ස් අංකය : 011- 2243613.

04-542

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංක : 8985281 සහ 9048390.
ද රිට්ස් ටුවරිස්ට් ගෙස්ට් හවුස් ඇන්ඩ් රෙස්ට්ටුරන්ට් හි මහත්වරුන්ට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.03.14 දිනැති අංක 1854 දරන *ගැසට් පත්‍රයේ* හා 2014.02.28 දිනැති "ඩේලිනිව්ස්", " දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.05.24 වැනි දින පෙ. ව. 11.00 ට කොලොන්නාව, විහාර මාවතෙහි, අංක 50/3 හි පදිංචි තුසිත කරුණාරත්න මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි අංක 540 A දරන දෙහිවල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ දෙහිවල පිහිටි කැම්බල් පෙදෙසෙහි වරිපනම් අංක 37 දරන අලුත්වත්ත නමැති ඉඩමට, එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද, ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් සාදන ලද 1978 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2066 දරන පිඹුරෙහි ලොට් X 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X 3 උතුරට : කැම්බල් පෙදෙස ද, නැගෙනහිරට : ලොට් X 2 ද, දකුණට : දෙවන පටුමග සහ ලොට් 11BA14A ද, බස්නාහිරට : දුම්රිය මාර්ග ද, මායිම්ව එකී අංක 2066 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහසයයි දශම අටයි පහක බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි දෙහි 100/110 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඥානසම්බන්දන්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
වැල්ලවත්ත.

04-569

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

(1) ණය යොමු අංකය : 73406084
කහවලගේ උපුල් පෙරේරා මහතාට අයත් උකස්කරන ලද දේපළ විකිණීම

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.03.14 දිනැති අංක 1854 දරන ගැසට් පත්‍රයේ හා 2014.02.28 දිනැති "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.05.27 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක්පාරේ, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ හොරණ දකුණ අංක 615 A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ නගර සභා සීමාව තුළ හොරණ පිහිටි වැවේතැන්න නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් සාදන ලද 2010 ඔක්තෝබර් මස 01 දිනැති අංක 5391 දරන පිඹුරෙහි 2 L ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2L උතුරට : එකී අංක 5391 දරන පිඹුරෙහි නිරූපිත එම ඉඩමේ ලොට් 2j සහ ලොට් 2K (මීටර් 4.5 පළල පාරට වෙන් කළ කොටස) ද, නැගෙනහිරට ලොට් E ද, දකුණට ලොට් G ද, බස්නාහිරට බලයලත් මිනින්දෝරු වයි. බී. කේ. කොස්තා විසින් සාදන ලද 1982.01.19 දිනැති අංක 1525 දරන පිඹුරෙහි නිරූපිත එම ඉඩමේ ලොට් 1 ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් විසිදෙකයි දශම අටක (අ. 0 රූ. 2 පර්. 22.8) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි හයයි බින්දුවයි බින්දුවයි එකක බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර එහි ඇති ගහකොළ හා ගොඩනැගිලි මෙන්ම වෙනත් සියලු දේ සමග වේ.

ඒ සමගම මෙයට එකී හොරණ පිහිටි වැවේතැන්න නමැති ඉඩමෙහි අංක 5391 දරන පිඹුරෙහි ලොට් 2K ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති උතුරට පානදුර සිට රත්නපුර දක්වා වූ ප්‍රධාන පාර සහ ලොට් D ද, නැගෙනහිරට ලොට් D සහ E ද, දකුණට ලොට් 2 L ද, බස්නාහිරට ලොට් 2J,2H,2F (මීටර් 3.05 පළල පාර) 2E, 2C, 2B සහ 2A ද, මායිම් ව එකී අංක 5391 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනයි දශම නවයක (අ. 0 රූ. 0 පර්. 23.9) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි හයයි බින්දුවයි හතරයි හයක (හෙක්. 0.06046) බිම් ප්‍රමාණයකින් සමන්විත බෙදූ ඉඩම් කැබැල්ල මතින් පාරේ අයිතිය ද ඇත.

එකී හොරණ පිහිටි වැවේහේන නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු වයි. බී. කේ. කොස්තා විසින් සාදන ලද 1982 ජනවාරි මස 19 වැනි දිනැති අංක 1525 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා නිරූපණය කර ඇති එකී ලොට් 2 L සහ 2 K යන බෙදූ ඉඩම් කැබලි එනම්, එකී ලොට් 2 උතුරට : රත්නපුර සිට පානදුර දක්වා වූ ප්‍රධාන පාර සහ ලොට් D ද, නැගෙනහිරට : ලොට් D සහ E ද, දකුණට : ලොට් G ද, බස්නාහිරටː ලොට් 1 ද, මායිම්ව එකී අංක 1525 දරන පිඹුර ප්‍රකාර අක්කර එකයි රූඩ් එකයි පර්චස් දහසයයි දශම දෙකක (අ. 1 රූ. 1 ප. 16.2) හෙවත් හෙක්ටයාර බින්දුවයි දශම පහයි හතරයි හයයි අටයි තුනක (හෙක්. 0.54683) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 325/144 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් 2 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් මෑතක දී සාදන ලද මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත :-

එකී හොරණ පිහිටි වැවේහේන නමැති ඉඩමේ, එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත් අංක 5382 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : රත්නපුර සිට පානදුර දක්වා වූ පාර ද, නැගෙනහිරට : ලොට් D හා E ද, දකුණට : ලොට් G ද, බස්නාහිරටː අංක 1525 දරන පිඹුරෙහි ලොට් 1 ද මායිම්ව එකී අංක 5382 දරන පිඹුර ප්‍රකාර අක්කර එකයි රූඩ් එකයි පර්චස් දහයයි දශම පහක (අ. 1 රූ. 1 පර්. 10.5) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම පහයි තුනයි දෙකයි හතරයි එකක (හෙක්. 0.53241) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

එකී ලොට් 2 ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.01.13 දිනැති අංක 2517 දරන උකස් බැඳුම්කරය මත උකස් කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව ,
හොරණ.

04-568

---

### අමානා බැන්ක් ලිමිටඩ් - මාවනැල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාවනැල්ල නගරයේ හසන් මාවතේ පිහිටි "පාරේ වත්ත" නමැති ඉඩමට බලයලත් මානක එම්. එස්. එම්. අජ්වර්ඩ් විසින් 2008.10.11 වැනි දින අංක 6284/2008 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 05 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි මහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල ඇතුලු සියළු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 13.50

මෙම දේපළ නිව් ෆාරුක් ස්ටෝර්ස් යන නාමය සහ විලාසය යටතේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ඒ. එස්. එම්. ෆාරුක් සහ එන්. එම්. ෆාරුක් යන අය බන්ධනදායින් වශයෙන් අමානා බැන්ක් ලිමිටඩ් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම*.- මාවනැල්ල නගර මධ්‍යයේ සිට හෙම්මාතගම මාර්ගයේ මීටර් 100ක් පමණ ගමන් ගෙන වමට හැරී හසන් මාවතට හැරෙන්න. මෙම පාරේ මීටර් 50ක් පමණ ගිය පසු අදාළ දේපළ මෙම පාරට මුහුණලා වම් පසින් පිහිටා තිබේ.

2014 ක් වූ මැයි මස 06 වැනි දින පෙ.ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.02.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, 2014.02.12 වැනි දින ඩේලිමිරර්, දිනමිණ සහ වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය ඃ-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න ඃ නීති ප්‍රධානී, අමානා බැන්ක් ලිමිටඩ්, අංක 480, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක ඃ 011-7756000/ ෆැක්ස් අංකය ඃ 011-2574419.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක ඃ 071-4755974/071-8446374/077-7761706.
දුරකථන අංක/ෆැක්ස් ඃ 081-2210595

04-565

---

## ඩී එෆ් සී සී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 15882 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවට අයත්, දකුණු උඩුවේ පිහිටි, මීදෙල්ලමුල හේන එස්ටේට් ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් සාදන ලද 2008 අගෝස්තු මස 25 වැනි දිනැති අංක 3210 දරන පිඹුරේ ලොට් අංක ඒ ලෙස දැක්වෙන (බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් සාදන ලද 2008 මාර්තු මස 01 වැනි දිනැති අංක 3087 දරන පිඹුරේ ලොට් අංක 1-11, ලොට් අංක 12 හි කොටසක්, ලොට් අංක 13 සහ ලොට් අංක 16-36 ලෙස දැක්වූ ඉඩම්වල නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වන) බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය ඃ අක්. 02, රූඩ් 03, පර්. 03.79
එහි පිහිටි වගාවන් සහ සියල්ල සහිතව.

මාලඹේ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඥාණසිරි විසින් සහතික කරන ලද, 2008 නොවැම්බර් මස 26 වැනි දිනැති අංක 15882 දරන උකස්කරය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නීතිගතවූ සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 549 බී ඉසුරු උයන ඩී. පී. විජේසිංහ මාවත, තලංගම දකුණ, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටි සී/ස ටර්බයින් වෙන්ටිලේෂන් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම් විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 මැයි මස 06 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*. - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 84,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්.
වසර 122ක සේවා විශිෂ්ඨත්වය සැමරුම.

*ප්‍රධාන කාර්යාලය ඃ*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය ඃ 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය ඃ 081-2224371
ඊමේල් ඃ schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය ඃ*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක ඃ 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය ඃ 011- 2588176
ඊමේල් ඃ schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

04-538